# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## ඒකක පරීක්ෂණය

| 11 ශ්‍රේණිය | පෙරදිග සංගීතය | 8 ඒකකය |
|---|---|---|

### ආදර්ශ ප්‍රශ්න පත්‍ර

01. චිත්‍රපට කලාවේ දේශීය ප්‍රවනතාවය සිදුවූ යුග තුන පිළිවෙලින් සිදු වූයේ,

(i). 1947, 1957, 1949 (ii). 1957, 1967, 1977 (iii). 1925, 1926, 1928 (iv). 1947, 1957, 1967

02. මුල් යුගයේදී චිත්‍රපට සඳහා සංගීතයෙන් දායක වූ සංගීත අධ්‍යක්ෂකවරයකු වූයේ (ඉන්දීය)

(i). නාරායන් අයියර් (iii). මොහිදින් බෙග්
(ii). මොහොමඩ් ගවුස් (iv). ආනන්ද සමරකෝන්

03. එම යුගවලින් මුල් යුගයේදී ගීත ගායනයෙන් දායක වූ ඉන්දීය ගායිකාවක් වනුයේ,

(i). එඩී ජයමාන්න (iii). ලතා මංගේෂ්කාර්
(ii). ජී.එස්.බී. රාණි (iv). වසන්තා සන්දනායක

04. දෙමළ චිත්‍රපට අනුකරණයෙන් නිර්මාණය වූ දේශීය චිත්‍රපටයක් වනුයේ,

(i). කඩවුණු පොරොන්දුව (iii). අශෝකමාලා
(ii). රේඛාව (iv). මාතලන්

05. ''සත් සමුදුර'' චිත්‍රපටයේ සංගීතය අධ්‍යක්ෂණය කළේ,

(i). ඩබ්ලිව්.ඩී. අමරදේව (iii). මහගම සේකර
(ii). සෝමදාස ඇල්විටිගල (iv). වික්ටර් රත්නායක

06. ''රේඛාව'' චිත්‍රපටයේ එන ප්‍රචලිත ගීතයක් ලෙස .............................................. හැඳින්විය හැකිය.

07. ''සත් සමුදුර'' චිත්‍රපටයේ ජනප්‍රිය ගීතයක් ලෙස ...................................................... ගීතය හැඳින්විය හැකි අතර එම ගීතය ගායනා කරනුයේ ...................................................... ශූරීන් විසිනි.

08. විදේශීය ගායන ශිල්පිනියක වන ...................................................... ගැයූ ''සිරි දූරු හෙළ දිව'' ගීතය ...................................................... චිත්‍රපටයේ සුමිහිරි ගීතයකි.

09. ශ්‍රී ලංකාවේ ප්‍රථම වර්ණ චිත්‍රපටය වූ ...................................................... යේ ප්‍රචලිත ගීතයක් ලෙස ...................................................... ගීතය නම් කළ හැකිය.

10. ''හුලවාලි'' චිත්‍රපටයේ එන ප්‍රචලිත ගීතයක් වන ...................................................... නමැති ජනප්‍රිය ගීතය ගයනුයේ ...................................................... නම් වූ ගායකයාය.

11. දේශීය චිත්‍රපට කලාවේ ස්වර්ණමය යුගය ආරම්භ වූයේ කුමන වර්ෂයෙන් පසුවද? එහිදී දේශීයත්වයට මුල්තැන දෙමින් නිර්මාණය වූ චිත්‍රපට මොනවාද? ඊට දායක වූ සංගීත අධ්‍යක්ෂකවරුන් හා ගායක ගායිකාවන් කවුරුන්ද? යන්න පැහැදිලි කරන්න.

12. ''සත් සමුදුර'' චිත්‍රපටය පිළිබඳ සංගීතමය ලක්ෂණ 5 ක් සඳහන් කරමින් එම චිත්‍රපටයේ ඇති විශේෂතා මොනවාද යන්න පැහැදිලි කරන්න.